# විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ට අධ්‍යාපනය ලබාදීම සම්බන්ධව ගුරුවරුන් දැනුවත් විය යුතු කරුණු.

- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් පුළුල් පරාසයකට අයත් වේ. මෙම පරාසය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමුන්ද සිටී. බොහෝ විට මෙවැනි ළමුන් ආබාධ සහිත ළමුන් ලෙසද හඳුන්වනු ලැබේ.

- එහෙත් විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සියල්ලම ආබාධ සහිත ළමුන් නොවන අතර, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සියලු ළමුන්ද, ආබාධ සහිත ළමුන් නොවේ.

- ආබාධ සහිත ළමුන් සියලු දෙනාටමද විශේෂ අධ්‍යාපණ ක්‍රම අවශ්‍ය නොවිය හැකිය. නමුත් මෙවැනි ළමුන්ට අධ්‍යාපනය අහිමි වන්නේ වෙනත් හේතු නිසාය. (උදාඃ- සමාජ ආකල්ප, සංස්කෘතික සාධක, පවතින අධ්‍යාපන ප්‍රවණතා, භෞතික පරිසරයේ ගැටළු, ප්‍රවාහන ගැටළු වැනි)

- කුමණ වර්ගයකට අයිතිවුවද "සැමට අධ්‍යාපනය" යන "Education for all" සංකල්පය අනුව සෑම ළමයෙකුම තම ජීවිත කාලයේ, අනිවාර්යයෙන් පාසැල් යා යුතු කාල සීමාවේදී, පාසැල් අධ්‍යාපනය ලැබිය යුතුවේ.

- මේ සඳහා සුදුසු ක්‍රමයක් ලෙස අන්තර්කරණ අධ්‍යාපනය (Inclusive Education) හඳුනාගෙන ඇත. මෙහිදී ළමුන්ගේ විවිධත්වයට ඉඩ සැලසීමත්, සැමට සම අවස්ථාවන් ලබාදීමත් අදහස් කෙරේ. සංකල්පයක් ලෙස මෙය ඉතා වැදගත් වන අතර, අප රටෙහි මෙවැනි සංකල්ප ක්‍රියාත්මක කිරීමේ බොහෝ අභියෝග ඇත.

- මේ සඳහා වඩාත් වැදගත් වන මානව සම්පත වන්නේ ගුරුවරුන්ය. ඔවුන් මේ පිළිබඳව දක්වන ආකල්ප මෙවැනි වැඩසටහන් සාර්ථක වීමට බෙහෙවින් බලපායි. මේ පිළිබඳව ගැඹුරින් අධ්‍යණය කිරීමට, පූර්ව සේවා සැසි හෝ සේවාස්ථ පුහුණු වැඩසටහන් අවශ්‍ය විය හැකිය.

- පාසැල් ළමයින්ගේ සක්‍රීය දායකත්වයත්, දෙමාපියන්ගේ සහ ප්‍රජාවේ සහයත් මෙවැනි වැඩසටහන් වලට අත්‍යාවශ්‍ය වේ.

- විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඉටුවිය යුතු ප්‍රධාන තත්ව වන්නේ - පෙනීමේ අපහසුතා, ඇසීමේ ඌනතා, ශාරීරික දුබලතා, බුද්ධිමය ඌනතා, භාෂා හා කථන ඌනතා, නිදන්ගත රෝගී තත්ව, ඔටිසම් තත්වය, මන්ද මානසික හා අධික්‍රියාකාරී තත්වය. චර්යාත්මක ගැටළු, බහුවිධ ආබාධ තත්ත්වයන් මීට අමතරව සුභග ළමුන්ටද විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇත. ඒ වගේම යම් සුවිශේෂ වූ ඉගෙනීමේ ඌනතා පෙන්වන ළමුන්ද ඇත.

- ඉහත තත්වයන්ට අදාළ වෛද්‍යමය කරුණු පදනම් කරගෙන රෝග විනිශ්චයක් තිබීම වැදගත් වන අතර, අධ්‍යාපණ ක්ෂේත්‍රය සඳහා (Education Diagnosis) අධ්‍යාපනික වශයෙන් ප්‍රයෝජනවත් වන නිගමන ලබාගැනීමද, ඉගෙනුම් - ඉගැන්වීමේ ක්‍රියාවලියට වැදගත් වේ.

- මෙවැනි ආබාධ තත්ව ඇති ළමුන් පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාගැනීමට වෛද්‍ය පුනරුත්ථාපන කණ්ඩායමේ සහායද අවශ්‍ය වේ. (වෛද්‍යවරුන්, චිකිත්සකයින්, මනෝ විද්‍යාඥයින්, සමාජසේවා නිලධාරීන් ප්‍රධාන වශයෙන් මෙයට අයත් වේ.) මේ පිළිබඳව ප්‍රතිපත්ති සකස් කරන විට ඔවුන්ගේ සහය ලබාගැනීම වැදගත් වේ.

- කුමන ක්‍රමයකින් හෝ ළමයෙකුට පාසැල් අධ්‍යාපනය ලබාදීමට අසීරු නම් ප්‍රජාව / නිවස මුල් කරගෙන (CBR) අධ්‍යාපණ ක්‍රමයක් සකසා දිය යුතුවේ.

- නොමේරූ මොළයට සිදුවී ඇති හානි නිසා පසු කාලීනව සංකීර්ණ ගැටළු මතුවිය හැකි බැවින් එවැනි දරුවන් හැකි තරම් කලින් හඳුනා ගැනීමත්, හැකි ඉක්මණින් මැදිහත් වීමත් මගින් එවැනි ගැටළු අවම කර ගත හැකිය.

- විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා පුළුල් පරාසයක පැතිර පවතී. (උදාඃ- විශේෂ සේවාවන්, උපකරණ, පරිසරය, ඉගෙන්වීමේ ක්‍රම අනුවර්තනය කරනු ලැබූ විෂය නිර්දේශ, පාඩම් සැලැස්ම, නම්‍යශීලී වැඩසටහන්, විවිධ ඇගයීම් ක්‍රම, ඉගෙනුම් ආධාරක වැනි.)

- විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාවලිය සම්බන්ධව නීත්‍යානුකූලව සකස් කරනු ලබන වැඩසටහන් වන්නේ පෞද්ගලික අධ්‍යාපන වැඩසටහනයි. (I.E.P). මෙම කටයුත්ත සඳහා ළමයා සහ දෙමාපියන්ද ඇතුළුව පුනරුත්ථාපන කණ්ඩායම් සියලු සාමාජිකයන් සහභාගී විය යුතුවේ. මෙම සැලැස්මට අනුව ළමයා ළඟා කර ගත යුතු කෙටි කාලීන මෙන්ම දීර්ඝ කාලීන ඉලක්ක ඇතුළත් වේ.

- අන්තර්කරණය විවිධ පැතිකඩ ඔස්සේ සිදුකළ හැකි වන අතර, ආබාධ සහිත දරුවකුට යම් කාලසීමාවක් සාමාන්‍ය පංති කාමරය තුළ ගත කිරීමටද අවස්ථාව සළසා දිය යුතුවේ. (අන්තර්කරණය - භෞතිකව පමණක්, සමාජයීය වශයෙන් හා අධ්‍යයන කටයුතු යන පැතිකඩවල් ඔස්සේ සිදු කළ හැකිය.)

- අවම බාධක ඇති පරිසරයක් (Least restrictive environment) ඇති කිරීම අන්තර්කරණ අධ්‍යාපනය මගින් අපේක්ෂා කෙරේ. හැකි තරම් කලින් ආබාධ තත්වය හඳුනා ගෙන නිසි ක්‍රමවේද මගින් නිවැරදි ගමන් මාර්ගයට යොමු නොවීම නිසා පසු කාලීනව ඉතාමත් සංකීර්ණ ප්‍රශ්ණ වලට ළමයාට මුහුණ පෑමට සිදු වේ.

- ප්‍රජා මූලික පුනරුත්ථාපන ක්‍රියාවලියේ (CBR) ප්‍රධානතම අංගයක් වන්නේ ප්‍රජාවේ ඇති සම්පත් වලින් ප්‍රයෝජන ගැනීමයි. මෙවැනි වැඩසටහන් වලින් ප්‍රජාවේ සියලුම පුද්ගලයන්ට යහපතක් සිදු වේ. භෞතික පරිසරයේ ඇති බාධක අවම කර ගැනීම තුළින් ආබාධ ඇතිවීම වළක්වා ගත හැකිය. (උදාඃ- පඩි පෙල් අවම කර ගැනීම, අත් ආධාරක සවි කිරීම් වැනි) පාසැල් තුළ ඇති මානව සම්පත මෙන්ම ප්‍රජාවේ ඇති සංවිධානද මේ සඳහා දායක කර ගත හැකිය. තාක්ෂණික සහය පුනරුත්ථාපන කණ්ඩායමෙන් ලබා ගත හැකිය. ප්‍රජාවේ සිටින සම්පත් පුද්ගලයන් ලෙස විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ, අධ්‍යාපනික ක්‍රියාවලියට දායකවීමට අමතරව, ගුරුවරුන්ට මෙම ක්ෂේත්‍රයට අදාළ බොහෝ සේවාවන් ඉටුකළ හැකිවේ.

- ආබාධ සම්බන්ධව සමාජයේ පවතින මිථ්‍යා මත දුරු කිරීම.

- දෙමාපියන්ට උපදේශණ සේවා ලබාදීම.

- උපදෙස් හා ප්‍රතිකාර ලබාගැනීමට නිවැරදි පුද්ගලයන් හා ස්ථාන වෙත යොමු කිරීම.

- ආබාධ සහිත ළමුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම.

- සමාජ වගකීමක් ලෙස ප්‍රජාවේ සිටින අනිකුත් සම්පත් දායකයින් සමඟ ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් වලට සහභාගී වීම. (ආගමික සංවිධාන, පාසැල් සංවර්ධන සමිති, ආදි ශිෂ්‍ය සංගම් හා ප්‍රජා සංවිධාන වැනි)

FAIR MED
Health for the Poorest
මෙය ශ්‍රී ලංකා ෆෙයාමෙඩ් පදනමේ පණිවිඩයකි.